**ශීර්ෂය 284 - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------------------

ශීර්ෂය 284 - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම, හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 10 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම, අදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

--------------------------

දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 2,191.85 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,832.06 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 359.79 ක් හෙවත් සියයට 16.41 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 1,054.67 | 1,041.91 | 12.76 | 1.21 |
| මූලධන | 1,137.18 | 790.15 | 347.03 | 30.52 |
| **එකතුව** | **2,191.85** | **1,832.06** | **359.79** | **16.41** |

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය සඳහා ආදායම් සංකේතයක් සඳහා එකතුව රු.මිලියන 20.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 25.40 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 27.00 ක් ඉක්මවා ආදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2016 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම | ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20-03-02-06 | 20.00 | 25.40 | 5.40 | 27.00 |

## 2.3 අත්තිකාරම් ගිණුම

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 28401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 50.00 | 49.99 | 38.00 | 38.78 | 147.00 | 141.10 |

## 2.4 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ 2016 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් 05 ක ශේෂවල එකතුව රු.මිලියන 269.75 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/000/0002/0158/000 | 10.56 |
| 6000/0000/000/0013/0111/000 | 4.18 |
| 6000/0000/000/0016/0101/000 | 64.74 |
| 6000/0000/000/0018/0103/000 | 10.53 |
| 6000/0000/000/0019/0025/000 | 179.74 |
| **එකතුව** | **269.75** |

**2.5 විගණන නිරීක්ෂණය**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | | | |
|---|---|---|---|
| (i) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| (ii) | නිවාඩු පිළිබඳ ලේඛනය | ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 | කිලිනොච්චිය පශු වෛද්‍ය කාර්යාලය, බකමූණ බීට්ටු කාර්යාලයේ ලේඛනය පවත්වා නොතිබුණි. |
| (iii) | අලි වෙඩි තොග ලේඛනය | 2013-10-16 දිනැති අංක 15/2003 දරන ගිණුම් චක්‍රලේඛය | මච්ආර, මාදුරු ඔය, සූංගාවිල, වව්නියා කලාපවල ලේඛනය පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iv) | ගිනි අවි හා පතරොම් බැහැර ගෙන යාමේ ලේඛනය | 2009-11-08 දිනැති අංක 05/2009 දරන ගිණුම් චක්‍රලේඛය | බස්නාහිර, කිලිනොච්චි, නල්ලතන්නිය, මච්ආර, වච්නියා අඩවිය, වච්නියාව කළාපය යන කාර්යාලවල ලේඛනය පවත්වා නොතිබුණි. |
| (v) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | යාවත්කාලීන කර නොතිබුණි |

**3.2 පොදු තැන්පත් ගිණුම**

**-----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** වර්ෂ 2 ක් ඉක්මවූ රු.81,403,951 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි

**(ආ)** මුදල් රෙගුලාසි 215(3) හි විධිවිධාන ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය නොලබා දෙපාර්තමේන්තුව විසින් වැය ගිණුමට හර කර තිබුණු එකතුව රු.2,403,144 ක මුදල පොදු තැන්පත් ගිණුමට මාරුකර තිබුණි.

**(ඇ)** මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතිය යටතේ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු.220,504,859 ක් අදාළ කාර්යභාරයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**(ඇ)** පශ්චාත් සුනාමි ව්‍යාපෘතිය වෙනුවෙන් ලද රු.1,945,719 ක් විගණන දිනය වූ 2016 දෙසැම්බර් 31 දින වන විටත් වියදම් නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**3.3 ආදායම් ගිණුම්**

**-----------------**

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් 20.03.02.06 දරන ආදායම් සංකේතයට අදාළව ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවැරි තිබුණි. එම ආදායම් සංකේතයට අදාළව සිදු කළ නියැදි විගණනයේදී මහකනදරාව, වීවල හා නිල්ගල සංචාරක බංගලා මාස 06 කට අධික කාලයක පමණ සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතීම නිසා සැලකිය යුතු ආදායමක් අහිමි වී තිබුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 28401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.803,463 ක් වී තිබුණි. එම හිඟහිටි ණය ශේෂ වර්ෂ 02 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2017 ජූනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.6 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කොහොලංකල සිට කරඹවැව දක්වා විදුලි වැට කිලෝමීටර 46 ඉදි කිරීම සඳහා 2014 වර්ෂයේ විදුලි වැටෙහි කිලෝ මීටර් 25.5 ක් ඉදි කිරීමට අවශ්‍ය භූමිය ඩෝසරයකින් සැකසීම සඳහා රු.2,951,842 ක් වැය කර තිබුණි. වැට ඉදි නොකිරීම හේතුවෙන් එම වියදම නිෂ්ඵල වී තිබුණි.

(ii) දෙපාර්තමේන්තුව සතු වාහන 55 ක් ධාවන තත්ත්වයේ නොතිබුණු බැවින්, ඒවා නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත තත්ත්වයේ පැවැතුණි.

(iii) මාදුරු ඔය ජාතික උද්‍යානය යටතේ වූ පුහුණු මධ්‍යස්ථානයක් ලෙස භාවිත කරනු ලැබූ (සෝෂල් ගොඩනැගිල්ල) කාමර 06 ක් හා දේශන ශාලාවක් සහිත විශාල ගොඩනැගිල්ලක් (දිග අඩි 60X45 පමණ) කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2017 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව 2017 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් භාණ්ඩ සමීක්ෂණය 2015 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

(ඈ) **වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

**----------------------------------------------------------------**

දිගු කාලයක් ගතවී තිබුණද විවිධ ආයතනවලින් ලැබී තිබුණු වාහන 10 ක අයිතිය පවරා ගැනීමට 2017 ජූනි 30 දින වන විටත් ක්‍රියාකර නොතිබුණි.

**3.7 කාර්යසාධනය**

**-----------------**

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**සැලැසුම් කිරීම**

**----------------**

වැය විෂයයන් 16 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් නොවූ ව්‍යාපෘති සඳහා රු.121,246,566 ක් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණි. වැය විෂයන් 14 ක් යටතේ රු.103,668,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු ව්‍යාපෘතීන් කිහිපයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.8 අවිධිමත් ගනුදෙනු**

**----------------------**

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) විල්පත්තු ජාතික උද්‍යානයේ කොක්මොටේ සූර්ය බල ජලනල පද්ධතිය සකස් කිරීම සඳහා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ ආයතනය වෙත රු.5,883,818 ක් ලබා දී තිබුණි. නමුත් එම කාර්ය මොණරාගල, හුලන්දාව ප්‍රදේශයේ ආයතනයක් විසින් ඉටු කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) වන අලි අනතුරුවලට ලක්විය හැකි ස්ථාන ආශ්‍රිතව දැනුවත් කිරීමේ විවරණ පුවරු 18 ක් සවි කිරීමට රු.6,855,000 ක බදු රහිත වටිනාකමකට ශ්‍රී ලංකා වනජීවී භාරයට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. ඒ සඳහා රු.1,350,000 ක අත්තිකාරම් ගෙවා තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට කාර්යය නිම කළ යුතු වුවත්, පුවරු 10 ක් පමණක් සවි කර තිබූ අතර සවි කරන ලද පුවරු කිහිපයක් ගැලවී තිබුණු බවද, පිරිවිතරයන්ට අනුකූලව විවරණ පුවරු සවි කර නොතිබුණු බවටද, තාක්ෂණික ඇගයීම් කමිටුව වාර්තාකර තිබුණි. එසේ වුවද එම විවරණ පුවරු යථා තත්ත්වයට පත් කිරීමට 2017 ජූනි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) බූන්දල ජාතික උද්‍යානයේ උඩමළල බිට්ටු ප්‍රදේශයට අයත් කොහොලංකල වැව 2015 වර්ෂයේදී රු.1,229,820 ක් වැයකර ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර වැව් බැම්මේ කටයුතු අවසන් කර තිබුණි. විගණිත දිනය වූ 2016 සැප්තැම්බර් 15 දින වන විටත් පිටවාන ඉදිකර නොතිබුණි. මේ නිසා වැවට එක්වන වැසි ජලය බොහෝ ප්‍රමාණයක් අපතේ යන අතර වැසිකාලයට දැනට වතුර ගලායන කාණුව තව තවත් පුළුල් වන බව නිරීක්ෂණ විය. මෙම තත්ත්වය වලක්වා ගැනීමට කටයුතු නොකළහොත් වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීමේ අරමුණද නිෂ්ඵල වන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) 2011 සැප්තැම්බර් 13 දින මන්නාරම කාර්ය මණ්ඩල නිල නිවාසය, අඩවි ආරක්ෂක කාර්යාලය හා කම්කරු නිල නිවාසය ඉදි කිරීම සඳහා රු.1,933,200 ක් කොන්ත්‍රාත්කරුට වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණි. විගණිත දිනය වූ 2016 ඔක්තෝබර් 30 දින වන විට වර්ෂ 5 ක පමණ කාලයක් ගත වී තිබුණද එම කාර්යය ආරම්භ කර නොතිබුණි. ගෙවා තිබුණු අත්තිකාරම්

සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු අත්තිකාරම් සුරක්ෂණයේ කාලය ඉක්මයාමට පෙර එම මුදල අයකර ගැනීමට හෝ එහි කාලය දීර්ඝ කර ගැනීමට හෝ දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**3.9 විසඳා නොතිබුණු විගණන ඡේද**

---------------------------------------

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2015 | 3.6(ඇ) | ජයන්තිපුර බත්තරමුල්ල නව ප්‍රධාන කාර්යාලයේ ඉදිකර ඇති ගොඩනැගිල්ලේ නීත්‍යානුකූල අයිතිය විගණිත දින වූ 2016 අප්‍රේල් 30 දින වන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**3.10 කළමනාකරණ දුර්වලතා**

---------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) මින්නේරිය ජාතික උද්‍යානයේ මායිමේ සිට මීටර් 150 ක් පමණ දුරින් ප්‍රේරක කළාපයෙහි මොරගස්වැව සීගිරිය මාර්ගයේ පොතාන ප්‍රදේශයේ අනවසරයෙන් ගොඩනැගිල්ලක් ඉදිකර සංවර්ධන කටයුත්තක් සිදුකර තිබුණි. 2009 අංක 22 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂන අඥා පනතේ (469 අධිකාරය) 3(අ)(2) වගන්තියට පටහැනිව එම ඉදිකිරීම් සිදු කර තිබුණි. 2017 ජුලි 10 දින වන විටත් ඒ සඳහා නීතිමය කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් නීතිමය කටයුතු කරමින් පවතින බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ආ) 1994 වර්ෂයේ අළුත්වැඩියා සඳහා යවන ලද වර්විල් වර්ගයේ බවුසර් රථය සහ ජීප්රථය ගරාජයේ රඳවා තිබීම හේතුවෙන් එම ආයතනය විසින් බිම් කුලියක් ලෙස රු.1,500,000 ක් ඉල්ලා 2007 දෙසැම්බර් 12 දින දෙපාර්තමේන්තුවට විරුද්ධව එන්තරවාසියක් එවා තිබුණි. මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තුන් දෙනෙකු ඇතුළත් කමිටුවක් විසින් නිර්දේශ ඉදිරිපත් කර තිබූ අතර එම නිර්දේශ අවසාන හා පූර්ණ සමස්තයක් ලෙස ක්‍රියා කිරීමට නෛතික බාධාවක් නොමැති බව නීතිපති විසින් 2013 අගෝස්තු 28 දිනැති අංක සී/131/2004 (උප) දරන ලිපියෙන් දන්වා තිබුණි. ආයතනයේ අයිතිකරුගෙන් අවස්ථා 03 ක දී එම නිර්දේශ සම්බන්ධයෙන් අදහස් හා එකඟතාවය අසා තිබුණද, 2017ජුලි මාසය වන විටත් ආයතනය විසින් මේ සම්බන්ධව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර 2015 පෙබරවාරි 12 දින වන විටත් පසු විපරම් කටයුතු කිසිවක් සිදු කර නොතිබුණි.

**3.11** **මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**------------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 61 | 28 | 33 |
| (ii) | තෘතියික මට්ටම | 32 | 25 | 07 |
| (iii) | ද්විතියික මට්ටම | 1,419 | 1,029 | 390 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 830 | 753 | 77 |
| | **එකතුව** | **2,342** | **1,835** | **507** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරින් 33 දෙනෙකුගෙන් ඉටු කර ගත යුතු රාජකාරි නිලධාරීන් 06 දෙනෙකු මඟින් ඉටු කර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කිරීම නිසා එක් නිලධාරියෙකුට තනතුරු කිහිපයක රාජකාරී ඉටු කිරීමට සිදුවී තිබුණි. තනතුරුවලට පූර්ණ කාලීන නිලධාරීන්ගේ සේවය අවශ්‍යව තිබියදී ඉහත පරිදි කටයුතු කිරීම නිසා රාජකාරි කටයුතුවල කාර්යක්ෂමතාවයට හානියක් සිදුවන බවද නිරීක්ෂණය විය.

(ආ) 2012 අගෝස්තු 21 දිනැති අංක ඞී.එම්.එස්/ජී2/56/2 දරන ලිපිය මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 30 ක් අනුමත කර තිබුණි. එම තනතුරුවලට බඳවා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබූ අතර එම තනතුරුවල රාජකාරි ඉටු කිරීම සඳහා 2006 වර්ෂයේ සිට අඩවි ආරක්ෂක නිලධාරීන් 18 දෙනෙකු පත් කර තිබුණි.